උසස් පෙළින් සරසවියට

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

උසස් පෙළ ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2025

| ක්‍රිස්තියානි ධර්මය | 12 ශ්‍රේණිය | 43 | S | II | කාලය පැය 3යි මිනි.10යි |
|---|---|---|---|---|---|

**උපදෙස් :**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1.
   i. දිවැසිවර ඉගැන්වීමේ ප්‍රධාන තේමා දෙකක් නම් කරන්න
   ii. යෙසායා 11:1-9 අනුව දෙවියන් වහන්සේගේ ආත්මානුභාවයේ ප්‍රතිඵල දෙකක් හා එහි අදහස සඳහන් කරන්න
   iii. ප්‍රඥාවේ ප්‍රභේද තුනක් නම් කර පැහැදිලි කරන්න
   iv. වර්තමානයේ දී ජන වන්දනාව සඳහා ගීතාවලිය යොදාගන්නා ආකාර අතරත් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

2.
   i. පැරණි ගිවිසුමේ බසාර් යන්න පසු කාලීනව බෙසෝරා බවට පරිවර්තනය විය එහි අර්ථය පැහැදිලි කරන්න
   ii. ශු. මතෙව් ශුභාරංචියේ ආවේනික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
   iii. ශු.ජොහන් ශුභාරංචියේ සඳහන් ස්වයං අනාවරණ ප්‍රකාශන තුනක් නම් කර එම ප්‍රකාශන ඉටු කිරීම සඳහා ඔබ විසින් ගන්නා ක්‍රියාමාර්ගය බැගින් ලියන්න
   iv. ධර්ම දානය මගින් අන් අය වෙත දේව රාජ්‍ය ළං කරවීම සඳහා ඔබ කරන යෝජනා හතරක් සඳහන් කරන්න

3. .
   i. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේදී ගත් අවසාන නිගමනයේ සඳහන් කරුණු දෙකක් නම් කරන්න
   ii. ශුද්ධ වූ පාවුලු තුමා පිළිප්පි සංගයට පැහැදිලි කරන ක්‍රිස්තුස් වහන්සේ බැහැපත් වූ ආකාර දෙකක් නම් කරන්න
   iii. කන්ද උඩ දේශනාවේ පරමාර්ථ තුනක් නම් කරන්න
   iv. ශු.මතෙව් 10:5-15 ධර්මදූත සේවය සඳහා යන්නන් විසින් අනුගමනය කළ යුතු උපදෙස් හතරක් සඳහන් කර ඔබ විසින් වර්තමානයේ ධර්මදූතයන් සඳහා දෙනු ලබන උපදේශයන් හතරක් සඳහන් කරන්න

(ලකුණු 2+4+6+8)

2 කොටස

4.

i. එස්රා හා නෙහෙමියා පර්සියානු යුගය තුළ  තම දායකත්වය සැපයූ ආකාරය කරුණු පහක් ඇසුරින් විස්තර කරන්න.

ii. රට මුහුණ දී ඇති අභියෝග හමුවේ වර්තමානයේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍යා සමාජ ප්‍රතිසංස්කරණ අංශ පහක් නම් කර එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පහදන්න

5.

i. ප්‍රේමයෙන් අඩ ගසන දෙවියන් වහන්සේට ප්‍රේමයෙන් ප්‍රති උත්තර දීම ඊශ්‍රායල් වරුන්ට අභියෝගයක් වූ අතර ඊට මුහුණ දීමේ හැකියාව ජනත කිරීමට ආදිපිතෘවරුන් ජනතාව මෙහෙය වූ ආකාරය නිදර්ශන පහක් ඇසුරින් පැහැදිලි කරන්න

ii. දේව කැඳවීම නිවැරදිව ඔබ වටහාගෙන නිසි ප්‍රතිචාර දැක්වීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග පහක් පැහැදිලි කරන්න

6.

i. දිවැසිවර ජෙරමියාගේ කැඳවීම දෙවිඳුන්ගෙන් ලද විශේෂ කැඳවීමකි. දේවධාර්මික ව්‍යුහය යටතේ ඊට ආවේණික ලක්ෂණ පහක් ඇසුරින් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න

ii. වර්තමාන සමාජය තුළ දිවැසිවරුන් ලෙස දේව පණිවිඩය ප්‍රකාශ කිරීමට හා ක්‍රියා කිරීමට ඔබට පැවරෙන වගකීම් පහක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න

7.

i. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීන ජන ජීවිතයේ දේශපාලන ආර්ථික සමාජය හා ආගමික පසුබිම පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සකස් කරන්න

ii. ශු. ජොහාන් තුමා ශුභාරංචිය ලිවීමේ පරමාර්ථ හා අනු පරපාර්ථ සඳහන් කර බහු ආගමික පරිසරයක වෙසෙන ඔබ ඔබේ මෙම සමාජයේ අධ්‍යාත්මික හා ආගමික අවශ්‍යතා සපුරා ගන්නා ක්‍රියාමාර්ග පහක් සඳහන් කරන්න

8.

i. ක්‍රිස්තුන් වහන්සේ වදාළ භාග්‍යය අට "සාරධර්ම සංග්‍රහයකි" මෙම අදහස කරුණු පහක් ඇසුරෙන් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න

ii. දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීමේදී වර්තමානයේ මුහුණ දීමට සිදුවන අභියෝග 5ක් නම් කර ඉන් ජයගන්නා ආකාරයේ නිදර්ශන සහිතව පැහැදිලි කරන්න

(ලකුණු 10+ 10)